"මහණෙනි, මේ දුක් නැති කිරීම නම් වූ උතුම් සත්‍යය (නිවන) කවරේද? එම තණ්හාවගේ ඉතුරු නොවන යම් නොඇලීම නම් වූ නිරුධ (නැති) කිරීමක් වේද, සම්පූර්ණයෙන් දුරලීමක් වේද, මිදීමක් (ගැලවීමක්) වේද, ආලය නොකිරීමක් වේද එයයි.

"ලොකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේද, යමක් සැප ස්වභාව ඇත්තේද, පහවනු ලබන්නා මේ තණ්හාව මෙහි නැති වේ. ලොකයෙහි ඇසද, කණද, නාසයද, දිවද, කයද, සිතද, ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. යමක් සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැතිවන්නාවූමේ තණ්හාව මෙහි නැති වන්නේය.

"ලොකයෙහි රූපයද, ශබ්දයද, ගඳ, සුවඳද, රසයද, ස්පර්ශයද, ධර්මයද ඒසේමය.

"ලොකයෙහි චක්ඛු ආදී සොත මනොවිඤ්ඤාණද ඒසේමය.

"ලොකයෙහි චක්ෂු ආදි ස්පර්ශය ඒසේමයද. ලොකයෙහි ඇසහා රූපය, කණ හා ශබ්දයද, නාසය හා ගන්ධයද, දිව හා රසයද මය හා ස්පර්ශයද ස්ත හා අරමුණ ගැටීමෙන් උපදින වේදනාද ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු මේ තණ්හාව මෙහි පහවන්නේය, නැතිවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නේය.

"ලොකයෙහි රූපය ආදි හැගීම් ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නේය. නැතිවනු ලබන්නාවූ මෙ තණ්හාව මෙහි නැතිවන්නේය.

"ලොකයෙහි රූපය ආදීයෙහි පැවති සිත වන්නීය. පැවති සිතද ප්‍රිය ස්වභාව ඇත්තේය, සැපස්වභාව ඇත්තේය පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නිය නැතිවන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය.

"ලොකයෙහි රූප ආදීයෙහි තණ්හාව රූපය ආදීය නිසා උපදින චේතනාද රූපයෙහි ආදීයෙහි පැවති විතර්කයද ලොක ප්‍රිය ස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. පහවනු ලබන්නාවූ මේ තණ්හාව මෙහි පහවන්නිය නැති වන්නාවූ මේ තණ්හාව මෙහි නැති වන්නීය මහණෙනි, මෙය දුක්ඛ නිරෝධ ආර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.